ලේකම් / செயலாளர் / Secretary
දුරකථනය / தொலைபேசி / Telephone 2449959
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk
ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785
Web Site: www.moj.gov.lk

**අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

**நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு**

**Ministry of Justice, Prison Affairs and Constitutional Reforms**

තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. 555
ඉලෙක්ට්‍රෝනික තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov.lk
නො 19, ශ්‍රී සංඝරාජ මාවත කොළඹ 10
இல 19, ஸ்ரீ சங்கராஜ மாவத்த கொழும்பு 10
No 19, Sri Sangaraja Mw Colombo 10

මගේ අංකය / எனது இல / My No. MOJ/E13/FL/2022/III

ඔබේ අංකය / உமது. இல. / Your No.

දිනය / திகதி / Date 2023.05. 17

සියලුම සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන්/වරියන්
සියලුම මහාධිකරණ විනිසුරුවරුන්/වරියන්
සියලුම දිසා විනිසුරුවරුන්/වරියන්
සියලුම දිසා /මහේස්ත්‍රාත් විනිසුරුවරුන්/වරියන්
සියලුම කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්/වරියන්

<u>ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022, 14/2022(I) හා 14/2022(II) හා බැඳේ.

02. උක්ත චක්‍රලේඛ ප්‍රකාරව දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීමේදී අත්‍යාවශ්‍ය සේවා ගණවල නිලධාරීන්ද මෙම නිවාඩු ලබා ගැනීම නිසා තම ආයතනවල කටයුතු පවත්වාගෙන යාමට දැඩි අපහසුකාරී තත්ත්වයක් පැන නැගී ඇති බවට ඇතැම් ආයතන ප්‍රධානීන් මා දැනුවත් කර ඇත.

03. එබැවින්, උක්ත චක්‍රලේඛ ප්‍රකාරව නිවාඩු ලබා දීමට අපහසු ඔබ ආයතනයේ සේවයෙහි නියුතු අත්‍යාවශ්‍ය සේවා ගණයට ගැනෙන නිලධාරීන් සිටී නම්, එම සේවා ගණ පිළිබඳ තොරතුරු 2023.06.04 වන දිනට පෙර මා වෙත දැනුම් දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

ලේකම් / செயலாளர் / Secretary
දුරකථනය / தொலைபேசி / Telephone 2449959
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785

Web Site: www.moj.gov.lk


අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு

Ministry of Justice, Prison Affairs and Constitutional Reforms


තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. 555
ඉලෙක්ට්‍රෝනික තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov

නො 19, ශ්‍රී සංඝරාජ මාවත කොළඹ 10
இல 19, ஸ்ரீ சங்கராஜ மாவத்த கொழும்பு 10
No 19, Sri Sangaraja Mw Colombo 10


මගේ අංකය / எனது இல / My No. MOJ/E13/FL /2022/III

ඔබේ අංකය / உமது. இல. / Your No.

දිනය / திகதி / Date 2023.05. 22

"ඉතා හදිසියි"

සියලුම සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන්/වරියන්
සියලුම මහාධිකරණ විනිසුරුවරුන්/වරියන්
සියලුම දිසා විනිසුරුවරුන්/වරියන්
සියලුම දිසා /මහේස්ත්‍රාත් විනිසුරුවරුන්/වරියන්
සියලුම කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්/වරියන්

**<u>ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2023.05.17 දිනැති ලිපියට වැඩිමනක් වශයෙනි.

02. ඒ අනුව රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක EST6/03/LEA/3165(5) හා 2023.05.15 දිනැති ලිපිය අනුව (එම ලිපියෙහි පිටපතක් මේ සමඟ යොමු කරමි.) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022,14/2022(I) හා 14/2022(II) ප්‍රකාරව දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීමේදී ඔබගේ ආයතනයන්ට මුහුණ පෑමට සිදුවී ඇති දුෂ්කරතා හා ඒ සම්බන්ධ යෝජනා **2023.05.24** දිනට පෙර මා වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

ආර්.එස් හපුගස්වත්ත
අතිරේක ලේකම්(පාලන)
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

දුරකථන අංකය - 0112438181
ෆැක්ස් අංකය - 0112438181
විද්‍යුත් තැපැල - addlsecadmin@moj.gov.lk

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ආයතන අංශය
தாபனப் பிரிவு
Establishments Division

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence Square, Colombo 07.

දුරකථන / தொலைபேசி : 011-2696211-13 / Telephone
ෆැක්ස් / பெக்ஸ் : 011-2692158 / Fax
ඊ-මේල් / ஈ-மெயில் : dge@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையதளம் : www.pubad.gov.lk / Website

Adsu (Ad)
17/5

RECEIVED
17 MAY 2023
Secretary's Office
Ministry of Justice,
Prison Affairs and
Constitutional Reforms

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல : / My No | EST-6/03/LEA/3165(5) | ඔබේ අංකය / உமது இல : / Your No | දිනය / திகதி : / Date 2023.05.15 |

Sec. office

**"ඉතා හදිසියි"**

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 14/2022(I) සහ 14/2022(II) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමාලෝචනය සිදු කිරීම</u>**

ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රජයේ නිලධරයන්ට දේශීය / විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම සඳහා විධිවිධාන සලසමින් නිකුත් කළ 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 2022.09.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(I) සහ 2022.09.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(II) වෙත කාරුණික අවධානය යොමු කරවමි.

02. උක්ත චක්‍රලේඛ විධිවිධාන අනුව නිලධරයන් නිවාඩු ලබා ගැනීම හේතු කොට ගෙන තම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන මඟින් සපයනු ලබන සේවාවන් කාර්යක්ෂමව හා ඵලදායීව සැපයීමේ ඇති දුෂ්කරතාවට තමන් මුහුණ දී ඇති බවට විවිධ නියෝජනයන් මෙම අමාත්‍යාංශය වෙත ලැබී ඇති අතර මේ පිළිබඳව ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2023.05.10 දින පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේ දී සාකච්ඡා කරන ලදී.

03. එබැවින්, උක්ත චක්‍රලේඛ මඟින් අපේක්ෂිත අරමුණු මේ වන විට කොතෙක් දුරට ඉටු වී තිබේ ද යන්න පිළිබඳව සහ මෙම චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනික සේවා සැපයීම සම්බන්ධයෙන් සිදුව ඇති බලපෑම පිළිබඳව කඩිනම් සමාලෝචනයක් සිදු කළ යුතුව ඇත.

04. ඒ අනුව, ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය / විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති යථෝක්ත චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී ඔබගේ ආයතනයන්ට මුහුණ පෑමට සිදු වී ඇති දුෂ්කරතා හා ඒ සම්බන්ධ යෝජනා 2023.05.29 දිනට පෙර මෙම අමාත්‍යාංශය වෙත ලබා දීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

කේ.ඩී.එන්. රංජිත් අශෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk

පිටපත -
ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කාරුණික දැ.ගැ.ස.

FAX NO. : 0112692158 ... 2023 16:52 PM P1